// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1770/17 - 2012 අගෝස්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාත් සභාව

වයඹ පළාතේ, පළාත් සභාවේ 2012 අංක 02 දරණ වයඹ පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2012.06.05 වැනි දින සම්මත කරන ලදුව, 2012.07.02 වැනි දින වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කෙරේ.

පද්මිණි කාරියවසම්,<br>ලේකම්,<br>වයඹ පළාත් සභාව.

2012 අගෝස්තු මස 06 වැනි දින,<br>කුරුණෑගල.<br>වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේදීය.

දීර්ඝ නාමය.

වයඹ පළාත තුළ තිරසාර සංවර්ධනයක් උදෙසා වූ පළාත් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ අරමුණු ලඟා කර ගැනීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය ද, කෘෂිකාර්මික සේවා ද ඇතුළුව පළාත් බද කෘෂිකර්මය සහ (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන ලෙස නාමෝද්දිෂ්ඨ ආයතන හැර) කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම සඳහා සහ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ වයඹ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2012 අංක 02 දරන වයඹ පළාත් කෘෂිකර්ම ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙය වයඹ පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලත් දින සිට ක්‍රියාක්මක වන්නේය.

ප්‍රඥප්තියේ අරමුණු.

2. මෙම ප්‍රඥප්තියේ අරමුණු පහත සඳහන් පරිදි වේ :

(i) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාතේ කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කරවීම සහ මෙහෙයවීම ;

(ii) ගොවි ජනතාවගේ ජීවනෝපාය උසස් කරලීම පදනම් වූ කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය හා කෘෂි කාර්මික සේවා ද ඇතුළුව පළාත් බද කෘෂිකර්මය සහ කෘෂිකාර්මික පර්යේෂණ සඳහා වැඩසටහන් සම්පාදනය කර පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රතිපාදන සැලැස්වීම ;

(iii) ප්‍රඥප්තියේ සඳහන් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම ;

(iv) පළාත් කෘෂිකර්ම කමිටුව පිහිටුවීම ;

(v) කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ ස්වේච්ඡා සංවිධාන පිහිටුවීම හා ලියාපදිංචි කිරීම ;

(vi) කෘෂිකර්ම ක්ෂේත්‍රයේ කටයුතුවල යෙදෙන වෙනත් ආයතන ලියාපදිංචි කිරීම ;

(vii) කෘෂිකාර්මික කටයුතුවලට අදාළ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වෙච්ඡා සංවිධාන, සහ පුද්ගලයින් සම්බන්ධීකරණය සහ ක්‍රියාකාරී දායකත්වය ලබාගැනීම ;

(viii) වයඹ පළාතට ආවේණික දේශීය හා සම්ප්‍රදායික කෘෂිකාර්මික සංස්කෘතීන් සහ සම්පත් ප්‍රවර්ධනය, සංරක්ෂණය හා ව්‍යාප්තියට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.

(ix) වගා නොකරන ඉඩම් වගා කිරීමට පෙළඹවීම ;

(x) වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භෞතික හා මානව සම්පත් විධිමත්ව උපයෝගී කර ගැනීම සඳහා ප්‍රතිපාදන සැලසීම.

## 1 වැනි කොටස

*ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීම*

කෘෂිකර්ම ප්‍රතිපත්තිය සම්පාදනය.

3. ජාතික ප්‍රතිපත්තියට අනුකූලව වයඹ පළාත තුළ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම පළාත් අමාත්‍යාංශය වෙත පැවරෙන්නේය. ඒ සඳහා පළාත තුළ ස්ථාපිත කෘෂිකර්ම කමිටුවල සහ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන, ස්වේච්ඡා සංවිධාන හා පුද්ගලයින්ගේ යෝජනා ලබාගත හැකි වන්නේය.

පළාත් කෘෂිකර්ම සැලැස්ම.

4. පළාත තුළ භූමි ප්‍රමාණයට සාපේක්ෂව ජනගහන ව්‍යාප්තිය, භූගෝලීය සාධක, දේශගුණික තත්වයන්, පාරිසරික බලපෑම්, ගමනා ගමන පහසුකම් හා වෙනත් නිර්ණායකයන් පදනම් කරගෙන වසර 05කට වරක් පළාත් කෘෂිකර්ම සැලැස්ම වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් සකස් කර වයඹ පළාත් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේය.

කෘෂිකාර්මක සේවාවන් සැපයීම.

5. පළාතේ ගොවි ජනතාවට අවශ්‍ය වන කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, අලෙවිය හා අලෙවි සම්බන්ධීකරණය සහ පළාත් බද පර්යේෂණ ඇතුළුව කෘෂිකාර්මික සේවාවන් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුකූලව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ දෙපාර්තමේන්තුව විසින් සැපයිය යුතු වන්නේය.

කෘෂිකාර්මික කලාප හා ව්‍යාප්ති කොට්ඨාශ නිර්ණය කිරීම.

6. පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, දේශගුණික තත්ත්වයන්, පාරිසරික බලපෑම් සහ ගමනා ගමන පහසුකම් ආදිය පදනම් කරගෙන කෘෂිකාර්මික කලාප සහ කෘෂිකර්ම ව්‍යාප්ති කොට්ඨාස නිර්ණය කිරීම සිදුකළ හැකි වන්නේය.

අමාත්‍යවරයා සතු බලතල.

7. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග සකස් කිරීම, උපදෙස් නිකුත් කිරීම හා මග පෙන්වීම වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම විෂයභාර අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි වන්නේය.

අභියාචනා කිරීම.

8. (1) මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ හෝ කිසියම් නිලධාරියෙකු විසින් කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත අභියාචනයක් කළ හැක්කේය.

(2) අමාත්‍යවරයාගේ නියෝගය මත ලේකම්වරයා විසින් පත්කරනු ලබන නිලධාරියෙකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඒ පිළිබඳව කරනු ලබන පරීක්ෂණයක නිර්දේශ මත එම නියමය හෝ තීරණය තහවුරු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ සංශෝධනය කිරීම හෝ අමාත්‍යවරයා විසින් කළ හැකි වන්නේය.

ලේකම්වරයා සතු බලතල.

9. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන උපදෙස් හා මග පෙන්වීම් යටතේ පළාත් කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කරවීම, මෙහෙයවීම සහ පාලනය ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේය.

## II වැනි කොටස

*පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංයුතිය, බලතල හා කාර්යය භාරය*

දෙපාර්තමේන්තුව පිහිටුවීම.

10. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවනු ලැබිය යුතු වන්නේය.

පළාත් අධ්‍යක්ෂවරයා පත් කිරීම.

11. දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා "වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා" යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ පළමු පන්තියේ නිළධාරියෙකු පළාත් අමාත්‍යවරයාගේ එකඟතාවය මත වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේය.

නිලධාරීන් පත්කිරීම.

12. (1) අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට සහ කළමනාකරණය සඳහා අවශ්‍ය වන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්. කෘෂිකර්ම උපදේශකවරුන්, ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්තිකාරකයින් හා අනෙකුත් නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට පත් කළ යුතු වන්නේය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට වයඹ පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ගත තනතුරු දැරූ සියළුම නිලධාරීන් සහ සේවකයින් මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවා සේ සැලකිය යුතු වන්නේය.

පළාත් අධ්‍යක්ෂවරයා සතු බලතල.

13. (1) ලේකම්වරයාගේ සාමාන්‍ය පරිපාලනයට යටත්ව මෙම ප්‍රඥප්තියෙහි හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා හෝ පනවනු ලබන නියෝග හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ බලතල අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය.

(2) අධ්‍යක්ෂවරයා විසින් අවස්ථාවෝචිත පරිදි ස්වකීය බලතල දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරීන්හට පවරා ක්‍රියාත්මක කළ හැකි වන්නේය.

කලාප කාර්යාල හා උපදේශක කාර්යල පිහිටුවීම.

14. කෘෂිකාර්මික දේශගුණික කලාප මට්ටමින් කෘෂිකාර්මික කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන කලාපීය කෘෂි සම්පත් මධ්‍යස්ථාන සහ කෘෂිකර්ම උපදේශක කාර්යාල පිහිටුවා පවත්වාගෙන යායුතු වන්නේය.

පුහුණු අංශ පිහිටුවීම.

15. කෘෂිකාර්මික අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපන හා පුහුණු අංශයක් හෝ ඒකකයක් පිහිටුවිය හැක්කේය.

පර්යේෂණ ආයතන පිහිටුවීම.

16. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන ලෙස නාමෝද්දිෂ්ඨ ආයතන හැර පළාතට අවශ්‍ය විය හැකි පර්යේෂණ කටයුතු සඳහා ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම කළ හැකි වන්නේය.

වාර්ෂික සැලැස්ම.

17. පළාත් කෘෂිකාර්මික සැලැස්ම පදනම් කරගනිමින් පළාත තුළ ඇති කෘෂිකාර්මික ආයතන සංවර්ධනය හා කෘෂිකාර්මික කටයුතුවල ප්‍රවර්ධනය සඳහා වූ සංවර්ධන සැලැස්ම අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂිකව සකස් කර ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු වන්නේය.

දෙපාර්තමේන්තුවේ කාර්යය භාරය.

18. පළාත තුළ කෘෂිකාර්මික කටයුතුවල සංවර්ධනය, ප්‍රවර්ධනය සහ ව්‍යාප්තිය සඳහා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සේවාවන් පවත්වාගෙන යා යුතු වන්නේය :

(i) කෘෂිකාර්මික ව්‍යාප්ති හා පුහුණු උපදේශන සේවාවන් පැවැත්වීම.

(ii) පළාත්බද කෘෂිකාර්මික පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම.

(iii) පළාත සඳහා කෘෂිකාර්මික සංවර්ධන සැලසුම් හා වාර්ෂික සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීම.

(iv) ජාතික හෝ පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමේ පර්යේෂණ ආයතන හෝ විශ්ව විද්‍යාල හෝ කෘෂිකර්මයට සම්බන්ධ වෙනත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

(v) කෘෂිකාර්මික කටයුතු සඳහා යෝග්‍ය තාක්ෂණය හඳුන්වා දීම.

(vi) උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය හඳුන්වා දීම සහ අලෙවිය.

(vii) කාබනික හා රසායනික පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය සහ කෘෂිකාර්මික උපකරණ හඳුන්වා දීම.

(viii) කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීම.

(ix) කෘෂිකාර්මික කටයුතු සඳහා ණය ආධාර ලබාදීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(x) කෘෂිකාර්මික සංවර්ධන සමිති, කාන්තා ගොවි සමිති, තරුණ ගොවි සමිති සහ පාසල් පද්ධතිය අදාළ කරගෙන කෘෂිකර්මය නඟා සිටුවීමට කටයුතු කිරීම.

(xi) පළාත් ආහාර හා පෝෂණ සුරක්ෂිතතා ඉලක්කයන් සපුරාලීම ඉටුවන අයුරින් සැලසුම් ක්‍රියාත්මක කිරීම.

(xii) පළාත තුල ක්‍රියාත්මක කෘෂිකාර්මික වැඩසටහන් පිළිබඳ දත්ත පද්ධති පවත්වා ගැනීම හා අවශ්‍ය ආයතනවලට ලබාදීම.

(xiii) කෘෂිකාර්මික නිෂ්පාදනවල ගුණාත්මක භාවය පවත්වා ගෙන යාම හා පසු අස්වනු තාක්ෂණය ව්‍යාප්ත කිරීමට කටයුතු කිරීම.

(xiv) කාබනික නිෂ්පාදන හඳුන්වාදීම, ප්‍රචලිත කිරීම හා අලෙවිය.

(xv) කාබනික පොහොර හා නිෂ්පාදන ආයතන පළාත් මට්ටමින් ලියාපදිංචි කිරීම සහ තත්ව සහතික නිකුත් කිරීම.

(xvi) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව පළාතේ බීජ හා රෝපණ ද්‍රව්‍යවල අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සහතික කිරීමේ සේවාවක් පවත්වාගෙන යාම.

(xvii) වගා හානි තක්සේරු වාර්තා නිකුත් කිරීම සහ ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම.

(xviii) පළිබෝධ නාශක භාවිතය සම්බන්ධයෙන් උපදෙස් සැපයීම.

(xix) දේශීය හා සම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු සහ සම්පත් සංරක්ෂණය හා ව්‍යාප්තියට අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.

## **III** වන කොටස

*පළාත් කෘෂිකර්ම කමිටුව*

පළාත් කෘෂිකර්ම කමිටුව.

19. පළාත් කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පහසු වනු පිණිස පළාත් කෘෂිකර්ම කමිටුවක් ස්ථාපිත කළ යුතු වන්නේය. පළාත් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා මෙම කමිටුවේ සභාපතිවරයා වන අතර පළාත් කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා කමිටුවේ ලේකම්වරයා වන්නේය. මෙම කමිටුව පළාත් සත්ව නිෂ්පාදන හා සංවර්ධන කමිටුව සමග ඒකාබද්ධව පැවැත්විය හැකි වන්නේය.

කමිටුවේ සංයුතිය.

20. (1) මෙම කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වන්නේය.

(i) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ මන්ත්‍රීවරුන්,

(ii) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන්,

(iii) වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ,

(iv) වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සත්ව සෞඛ්‍ය අධ්‍යක්ෂ,

(v) වයඹ පළාත් ඉඩම් කොමසාරිස්,

(vi) වයඹ පළාත් ඉංජිනේරු අධ්‍යක්ෂ,

(vii) වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,

(viii) කුරුණෑගල හා පුත්තලම නියෝජ්‍ය පොලිස්පතිවරු,

(ix) වයඹ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ,

(x) කුරුණෑගල සහ පුත්තලම ගොවිජන සේවා නියෝජ්‍ය හෝ සහකාර කොමසාරිස්වරුන්,

(xi) සාමාන්‍යාධිකාරී - වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය,

(xii) සාමාන්‍යාධිකාරී - වයඹ සංවර්ධන අධිකාරිය,

(xiii) අධ්‍යක්ෂ වයඹ පළාත් පරිසර අධිකාරිය,

(xiv) පළාත තුල ක්‍රියාත්මක වන කෘෂිකර්ම, සත්ව නිෂ්පාදන සහ වාරිමාර්ග කටයුතු වලට අදාළව ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රධානීන්,

(xv) දිස්ත්‍රික් අපනයන කෘෂිකර්ම සහකාර අධ්‍යක්ෂවරු කුරුණෑගල, පුත්තලම,

(xvi) වයඹ පළාතේ පොල්වගා කිරීමේ මණ්ඩලයේ ප්‍රාදේශීය කළමණාකරුවන්,

(xvii) කජු සංස්ථාවේ වයඹ පළාත් කළමණාකරු,

(xviii) ශ්‍රී ලංකා ජලජීවී හා වගා සංවර්ධන අධිකාරියේ කුරුණෑගල පුත්තලම දිස්ත්‍රික් ප්‍රධානීන්,

(xix) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් කළමණාකරුවන් කුරුණෑගල හා පුත්තලම,

(xx) වන සංරක්ෂණ දිස්ත්‍රික් නිලධාරීන් කුරුණෑගල, පුත්තලම,

(xxi) වයඹ පළාත් වනජීවී සහකාර අධ්‍යක්ෂ,

(xxii) පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍යතාවය මත නම් කරනු ලබන කලාප භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්,

(xxiii) පළාත් කළමණාකරු - වී අලෙවි මණ්ඩලය,

(xxiv) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ කුරුණෑගල පුත්තලම දිස්ත්‍රික් ප්‍රධානීන්,

(xxv) රාජ්‍ය බැංකු ප්‍රාදේශීය කළමණාකරුවන් හෝ ඔහු විසින් නම් කරන ලද නිලධාරියෙකු,

(xxvi) රාජ්‍ය නොවන බැංකුවල දිස්ත්‍රික් ප්‍රධානීන් කුරුණෑගල, පුත්තලම,

(xxvii) කෘෂිකර්මය හා සම්බන්ධ ප්‍රධාන සමාගම්වල පළාත් හෝ දිස්ත්‍රික් ප්‍රධානීන්,

(xxviii) කෘෂිකර්මය පිළිබඳ විශේෂ දැනුමක් ඇති ප්‍රවීණයන් දෙදෙනෙකු,

(xxix) කෘෂි නිෂ්පාදන සමිති බල මණ්ඩල නියෝජිතයින් දෙදෙනෙකු,

(xxx) ගොවි සංවිධාන බල මණ්ඩල නියෝජිතයන් දෙදෙනෙකු.

(2) අවස්ථානුකූලව අමාත්‍යවරයා විසින් රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතන හෝ සංවිධානවල නියෝජිතයන් කෘෂිකර්ම කමිටුවට කැඳවිය හැක්කේය.

කමිටුවේ සාමාජිකයින් පත් කිරීම.

21. මෙම ප්‍රඥප්තියේ 20. (1) උප වගන්තියේ I සිට XXVI දක්වා සාමාජිකයින් නිල බලයෙන් පත්වන අතර XXVII සිට XXX දක්වා සාමාජිකයින් අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි පත්කළ හැක්කේය.

සාමාජිකයින්ගේ ධූර කාලය.

22. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය එක් වසරක් වන්නේය.

සාමාජිකත්වය අහෝසි වීම.

23. අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන සාමාජිකයින්ගේ ධූර කාලය සම්පූර්ණවීම, ධූරයෙන් ඉල්ලා අස්වීම, අමාත්‍යවරයා විසින් ඔහුගේ අභිමතය පරිදි ධූරයෙන් ඉවත් කිරීම, අනුගාමී රැස්වීම් වාර 03කට සහභාගි නොවීම හෝ සාමාජිකයෙකුගේ මරණය හෝ සිහි විකලත්වය මත සාමාජිකත්වය අහෝසි වන අතර එම පුරප්පාඩු අමාත්‍යවරයා විසින් සම්පූර්ණ කළ යුතු වන්නේය.

කමිටුවේ රැස්වීම.

24. පළාත් කමිටුව යටත් පිරිසෙයින් මාස 02කට එක් වරක් බැගින් රැස්විය යුතු වන්නේය. අවශ්‍ය වන්නේනම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැකිය.

ගණ පූරණය.

25. (1) කමිටුවේ ගණ පූරණය සාමාජිකයින්ගෙන් 1/4 ක් විය යුතුය.

(2) සාමාජිකයින්ගේ පුරප්පාඩු පැවතීම කමිටු රැස්වීම් පැවැත්වීමට හෝ රැස්වීම්වල තීරණ ගැනීම සඳහා බාධාවක් නොවන්නේය.

කමිටුවේ බලතල හා කාර්යය භාරය.

26. පළාත් කෘෂිකර්ම කමිටුවේ කාර්යය භාරය පහත පරිදි වේ :

(i) ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සහ ප්‍රඥප්තියේ සඳහන් කාරණා සම්බන්ධයෙන් පළාතට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ii) ප්‍රඥප්තියේ සඳහන් කාරණා මෙහෙයවීමට සහ ක්‍රියාවේ යෙදවීමට අදාල උපදෙස් ලබාදීම.

(iii) පළාත් කෘෂිකර්ම සැලැස්ම අනුමත කිරීම.

(iv) පළාත් කෘෂිකර්ම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්පත් සහ සහාය ලබාදෙමින් ඒ පිළිබඳ පසු විපරම සහ ඇගයීම.

(v) පළාත තුල කෘෂිකර්ම සැලසුම් සකස් කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළුවල දී අවශ්‍ය තීරණ ලබාදීම.

(vi) පළාත තුල කිසියම් ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක් විසින් කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, සේවා සැපයීම, සහ පර්යේෂණ උදෙසා කිසියම් ව්‍යාපෘතියක් හෝ වැඩ සටහනක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන් අනුමැතිය ලබාදීම.

(vii) කෘෂිකාර්මික ඉඩම් කෘෂි ඵලදාව ලබාගැනීම සඳහා උපරිම මට්ටමින් යොදා ගැනීමට වගබලා ගැනීම.

කාර්යය පටිපාටි හා සහභාගිත්ව දීමනා.

27. (i) කමිටුව විසින් එහි රැස්වීම්වල කාර්ය කරගෙන යාම සඳහා අවශ්‍ය කාර්යය පටිපාටි සම්පාදනය කරගත හැක්කේය.

(ii) පළාත් කමිටුවේ රැස්වීම්වලට සහභාගි වන්නන් වෙනුවෙන් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේය.

## IV වන කොටස

*කෘෂිකාර්මික සංවර්ධන සමිති*

කෘෂිකාර්මික සංවර්ධන සමිති පිහිටුවීම හා ලියාපදිංචිය.

28. පළාතේ කෘෂිකාර්මික කටයුතුවල යෙදී සිටින ගොවීන් ඒකාබද්ධකර කෘෂිකාර්මික සංවර්ධන සමිති පිහිටුවා ගත හැකි අතර එම සෑම සමිතියක්ම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතු වන්නේය.

සමිතියේ නාමය.

29. මෙම ප්‍රඥප්තියේ 28 වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන සමිති කෘෂිකාර්මික සංවර්ධන සමිති නාමයකින් පවත්වාගෙන යායුත්තේය. එම කෘෂිකාර්මික සංවර්ධන සමිති යම් බෝගයක් හෝ යම් නිශ්චිත කෘෂිකාර්මික සංවර්ධන අරමුණක් හෝ අරමුණු සඳහා විය යුත්තේය.

පොදු ව්‍යවස්ථාව.

30. කෘෂිකාර්මික සංවර්ධන සමිති සඳහා පොදු ව්‍යවස්ථාවක් දෙපාර්තමේන්තුව විසින් සකස්කළ යුතු අතර එම ව්‍යවස්ථාව අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබූ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය. එම සමිතිවල පරිපාලනය හා මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් රීති පැනවීමේ බලය අමාත්‍යවරයාට පැවරේ.

31. කෘෂිකාර්මික සංවර්ධන සමිතිවලට පළාත්, කලාප හා ප්‍රාදේශීය වශයෙන් බල මණ්ඩල පිහිටුවා ගත හැකි අතර එම බල මණ්ඩල වල සංයුතිය, කාර්යය භාරය සහ පොදු විධිවිධාන සම්බන්ධයෙන් වන ව්‍යවස්ථාව දෙපාර්තමේන්තුව විසින් සැදිය යුතු අතර ඒ සඳහා පළාත් කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වන්නේය. කෘෂිකාර්මික සමිති බල මණ්ඩල.

32. කෘෂිකාර්මික සංවර්ධන සමිතිවල අරමුදල් වර්ධනය සඳහා රාජ්‍ය, පළාත්, හෝ රාජ්‍ය නොවන ව්‍යාපෘති මගින් ලබාදෙන මුදල් යොදවා ගත හැකි වන්නේය. සමිතිවල අරමුදල්.

33. (1) ලියාපදිංචි කෘෂිකාර්මික සංවර්ධන සමිතියක් පහත සඳහන් කාරණා එකක් හෝ කිහිපයක් මත ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා සහ ගණන් බේරා වසා දැමීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් ඈවරකරුවෙකු පත් කළ හැකි වන්නේය. ලියාපදිංචිය අවලංගු කිරීම හා ඈවර කිරීම.

(i) සමිතියේ සාමාජික සංඛ්‍යාව දොළහකට අඩුවීම,

(ii) එක් අවුරුද්දක් ඉක්මවන කාල පරිච්ඡේදයක් එය ක්‍රියාත්මක නොවීම,

(iii) සමිතියේ පරමාර්ථවලට පටහැනිව සමිතිය කටයුතු කර තිබීම,

(iv) සමිතිය එහි සාමාජිකයින්ගේ සුහසාධනය සඳහා කටයුතු කිරීමට අපොහොසත් වී ඇති බව ප්‍රකාශ කරමින් එම සමිතියේ සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් එකකට (1/4) කට නො අඩු සංඛ්‍යාවක් විසින් අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කිරීම.

(2) ඉහත 33.1 උප වගන්තිය යටතේ පත් කළ ඈවරකරුට පහත සඳහන් බලතල ඇත්තේය,

(i) සමිතියේ ණය හිමියන් අතර ප්‍රමුඛතාව සම්බන්ධයෙන් තීරණය කිරීම,

(ii) සමිතියේ දේපල විකිණීම,

(iii) ලේකම්වරයාගේ පූර්ණ අනුමැතිය ඇතිව සමිතිය විසින් හෝ ඊට එරෙහි හිමිකම් පෑම් කිසිවක් සමථයකට පත්කිරීම,

(iv) සමිතියේ වත්කම් නියමිත ආකාරයෙන් බෙදා හැරීම,

(3) ඈවරකරු විසින් කරනු ලබන අවලංගු කිරීම පිළිබඳ නිවේදනය පිළිවෙලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සංසරණය වන ප්‍රවෘත්ති පත්‍රයක පළකරනු ලැබිය යුතුය.

(4) සමිතිය ඈවර කිරීමේදී එහි අරමුදල ඈවර කිරීමේ වියදම පියවීම සඳහා ප්‍රථමයෙන් යෙදවිය යුතු අතර ඉක්බිතිව එහි බැරකම් වලින් නිදහස් වීම සඳහා යෙදවිය යුතුය. ඈවර කිරීම නිම කිරීමෙන් පසුව ඉතිරිවන අතිරික්තය පළාත් සභා අරමුදලට බැරකරනු ලැබිය යුතුය.

## V වන කොටස

*පොදු විධිවිධාන*

34. කිසියම් ආයතනයක්, සංවිධානයක්, පදනමක්, සංසදයක්, ව්‍යාපෘතියක්, වැඩසටහනක් හෝ එවැනි සමගාමී ආයතනයක්, පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් පළාත තුල කෘෂිකාර්මික ව්‍යාප්තිය, ප්‍රවර්ධනය, අධ්‍යාපනය, කෘෂිකාර්මික සේවා සැපයීම, සහ පළාත් බද පර්යේෂණ උදෙසා කිසියම් කටයුත්තක් සිදු කිරීමට පෙර පළාත් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබාගත යුතු වන්නේය. කෘෂිකාර්මික කටයුතු සඳහා අනුමැතිය ලබා ගැනීම.

35. මෙම ප්‍රඥප්තියේ 7 වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට්* පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එසේ පළකරනු ලැබූ දිනයේ සිට හෝ නියෝගයේ සඳහන් දිනක සිට හෝ එම නියෝගය ක්‍රියාත්මක විය යුතු වන්නේය. නියෝග *ගැසට්* පත්‍රයේ පළකිරීම.

36. අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම *ගැසට්* පත්‍රයේ පලකරණු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම ඒ යටතේ කලින් කරනු ලැබූ යම් කරුණකට අගතියකින් තොරව පරච්ඡින්න විය යුතු අතර, ඒ පිළිබඳව නිවේදනයක් *ගැසට්* පත්‍රයේ පලකරණු ලැබිය යුතුය. නියෝග සඳහා පළාත් සභා අනුමැතිය ලබා ගැනීම.

වැරදි

37. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ හෝ සාදන ලද යම් නියෝගයක් හෝ විධි විධානයක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම උවමනාවෙන්ම පැහැර හරින හෝ උවමනාවෙන්ම අවහිර කරන අයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරද කරුවෙකු වන්නේය.

නඩු පැවරීමේ බලය.

38. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදුකරනු ලැබූ විට නඩු පැවරීමේ බලය පළාත් අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරණු ලබන නිලධාරියෙකු සතු වන්නේය.

දඬුවම.

39. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදු කරණු ලබන සෑම තැනැත්තෙකුම මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකදී වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව රු. 20,000.00ක් නොඉක්මවන දඩයකට හෝ මාස 06 නොඉක්මවන කාලයකට බණ්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කල යුතු වන්නේ.

## VI වන කොටස

*අර්ථ නිරූපන*

අර්ථ නිරූපණ.

40. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස.

"පළාත" යන්නෙන් වයඹ පළාත ද,

"පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා ද,

"අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා ද,

"පළාත් අමාත්‍යාංශය" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශය ද,

"ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

"දෙපාර්තමේන්තුව" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ද,

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා ද,

"කෘෂිකර්මය" යන්නෙන් ජනතාවගේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කිරීම පිණිස වාණිජමය අරමුණු සහිතව හෝ රහිතව සියළුම ප්‍රයෝජනවත් ශාක වගා කිරීම සහ සංරක්ෂණය කිරීම ද,

"කෘෂිකාර්මික ප්‍රවර්ධනය" යන්නෙන් කෘෂිකාර්මික සම්පත් ප්‍රශස්ථ ඵලදායිතාවයක් දක්වා වර්ධනය කිරීම ද,

"කෘෂිකාර්මික ව්‍යාප්තිය" යන්නෙන් ආහාර සඳහා බෝගවල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා වූ තාක්ෂණික ක්‍රමවේදයක් ගොවීන් හා වෙනත් උනන්දු කණ්ඩායම් අතරට ගෙනයාම, ක්‍රියාත්මක කිරීම හා සහාය වීමේදී අවශ්‍ය සම්පත් සම්පාදනයට මැදිහත් වීම ද,

"කෘෂිකාර්මික අධ්‍යාපනය" යන්නෙන් ආහාර හා කෙඳි නිෂ්පාදන සඳහා බෝගවල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා වූ තාක්ෂණික ක්‍රමවේදයක් ගොවීන් හා වෙනත් උනන්දු කණ්ඩායම් අතරට ගෙනයාම, ක්‍රියාත්මක කිරීම හා සහාය වීමේදී ගොවීන් සහ අදාළ කණ්ඩායම් වෙත අවශ්‍ය වන්නා වූ දැනුම, කුසලතාවය ලබා දීම සහ ආකල්ප සංවර්ධනය කිරීම ද,

"කෘෂිකාර්මික සේවා" යන්නෙන් පළාත් බද කාර්ය සඳහා කෘෂිකර්ම ව්‍යාප්තියේ සහ ප්‍රවර්ධනයේ අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට අවශ්‍ය වෙතැයි නිශ්චය කරනු ලබන ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය නොවන හා ජීවී හෝ අජීවි යටිතල පහසුකම් සැපයීම ද,

"පළාත්බද කෘෂිකාර්මික පර්යේෂණ" යන්නෙන් පළාත් මට්ටමින් කෘෂිකාර්මික ක්‍රියාවලියේදී ඇති වන්නා වූ තාක්ෂණික ගැටළු සහ ඒ සම්බන්ධ ගැටළු තත්ත්වයන් නිරාකරණය කිරීම හා නිර්දේශ ලබා ගැනීම සඳහා සහ හඳුන්වා දෙනු ලබන තාක්ෂණ හා නිර්දේශවල අදාලත්වය තහවුරු කිරීම සඳහා පළාත් මට්ටමින් කරනු ලබන (මූලික සිද්ධාන්ත ගොඩනැගීම සඳහා වූ නොවන) අත්හදා බැලීම් ද,

"කමිටුව" යන්නෙන් වයඹ පළාත් කෘෂිකර්ම කමිටුව ද,

"සමිතිය යන්නෙන්" කෘෂිකාර්මික සංවර්ධන සමිති ද,

"කෘෂිකාර්මික සංවිධාන බල මණ්ඩල" යන්නෙන් ගොවි සංවිධාන හා නිෂ්පාදන සමිති ඒකාබද්ධව ගොඩ නගා ගත් ඒකකයක්ද,

"කුරුණෑගල" යන්නෙන් කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයද,

"පුත්තලම" යන්නෙන් පුත්තලම පරිපාලන දිස්ත්‍රික්කයද,

අදහස් වන්නේය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

41. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

08 - 681

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

2 - PG 001380